# ගුවන්විදුලි යන්ත්‍රය පැමිණීමත් සමග සිදු වූ සමාජ විපර්යාසය

ලක්මිණී දේශිකා මුණසිංහ

පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
deshimunasinghe@gmail.com

---

මිනිසාගේ කාර්මික ඥානය දියුණු වීමත් සමගම ප්‍රාථමික සමාජයකට හුරු වූ මිනිසාගේ හැසිරීම දියුණුවට පත් වූ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් විවිධ දේ සොයාගැනීම කෙරෙහි මිනිසා සිය අවධානය යොමු කර තිබේ. එම ක්‍රියාවලියට සමගාමීව පුරාවිද්‍යා විෂයය පථයේ ද පුළුල්වීමක් දක්නට ලැබෙන අතර කාර්මික විප්ලවය සමගම බිහි වූ නිමැවුම් හැදෑරීම ද විෂයයක් ලෙස පුරාවිද්‍යාවට එක්වී තිබේ. මෙම අධ්‍යයනයේ අරමුණවන්නේ ගුවන්විදුලි යන්ත්‍රය පැමිණීමත් සමගම නොදියුණු සන්නිවේදන රටාවකට හුරු වී සිටි ශ්‍රී ලංකික ජනතාවගේ සිදුවූ සමාජ වෙනස්වීම පිළිබඳව අධ්‍යයනය කිරීම ය. මෙම පර්යේෂණය සඳහා තොරතුරු සම්මුඛ සාකච්ඡා මාර්ගයෙන් ලබාගැනිණි. පර්යේෂණයේ දී හඳුනාගත් මූලික කරුණක් වූයේ ගුවන්විදුලි යන්ත්‍රය මෙරටට පිවිසීමත් සමගම ජනශ්‍රැතිය හුවමාරුව, කණ්ඩායම් ලෙස එක්වී සවස් කාලය ගත කිරීම වැනි සාමූහික විශ්‍රාන්ති ක්‍රියාකාරකම් ක්‍රමයෙන් සමාජයෙන් ඉවත්ව ගොස් ඇති බවය. මාධ්‍ය මෙවලමක් ලෙස ජනතාව අතරට එක්වූ ගුවන්විදුලි යන්ත්‍රයේ එහි කුතුහලය දනවන ලක්ෂණ නිසා ඉතා සීඝ්‍රයෙන් සමාජගත වී තිබේ. මේ හරහා සමාජයේ සිදු වූ ප්‍රධානතම වෙනස්කම වූයේ රාත්‍රී කාලය පුරා විහාරස්ථානයේ පැවති ධර්ම දේශනා කාලය ගුවන් විදුලිය ආගමනය සමගම කෙටි වේලාවකට සීමා වීමය. නමුත් පසුකාලීනව වෙනත් විද්‍යුත් මාධ්‍යයන්ගේ ආගමනයත් සමගම ගුවන්විදුලි යන්ත්‍රය කෙරෙහි ජනතාවගේ ඇල්ම අවම වී තිබේ.

ප්‍රමුඛ පද : ගුවන්විදුලි යන්ත්‍රය, විශ්‍රාන්ති ක්‍රියාකාරකම්, විද්‍යුත් මාධ්‍ය